OL/2010/50-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
**Drama and Theatre I, II**

පැය තුනයි
மூன்று மணித்தியாலங்கள்
*Three hours*

## නාට්‍ය හා රංග කලාව I

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

● පහත දැක්වෙන පද්‍ය ආශ්‍රයෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) වෙ ද නටන්නේ පළමුව සබේට එන්නේ
යොද කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කු දේ වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
වි ද පාන්නේ අත් දෙක තැගි කියන්නේ

(ii) රජුන් අණ විලසට
මුදලිදු බසින් සහ තුට
ආරච්චි මෙ සබෙට
ඒය විසිතුරු බලනු කදිමට

(iii) දේවදර වෘක්ෂ චම්පකා අශෝක චන්දනා
පූග තාල මූනමල් ද බිදිර මෙවන නන්දනා
බූරු ගෝණ හස්ති අශ්ව මේ වනේ පෙනෙත් විශාල
පෙනේ මෙතන වෘක්ෂ ශාල ගුමු නද දෙති භෘංග ලෝල

(iv) දුල් තිමල් සිසි සේ දිසි
සරදඹරේ - සිරි
කල් ලකල් නිතරේ-රැඳි-උර මැදුරේ-පුර මැදුරේ
කිත් පතළා-දිසි ළන්දු ගයන නිති
ඇන්දූ රසඳුන බන්ද මපිය නරනින්ද සසොබන

1. ඉහත (i) වැනි පද්‍යය අයත් වන්නේ කවර නාට්‍ය සම්ප්‍රදායට ද?
   (1) කෝළම් (2) සොකරි (3) නාඩගම් (4) නූර්ති

2. පහතරට ගැමි නාටකයකට අයත් වන පද්‍යයෙහි අංකය වන්නේ,
   (1) (i) ය. (2) (ii) ය. (3) (iii) ය. (4) (iv) ය.

3. 'උත්තරරාමචරිත' නූර්තියට අයත් වන පද්‍යයෙහි අංකය වන්නේ,
   (1) (i) ය. (2) (ii) ය. (3) (iii) ය. (4) (iv) ය.

4. නාඩගම් සම්ප්‍රදායට අයත් වන පද්‍යයෙහි අංකය වන්නේ,
   (1) (i) ය. (2) (ii) ය. (3) (iii) ය. (4) (iv) ය.

5. සියුම් උපහාසය හා හාස්‍ය රසය දනවන, කාරියකරවන රාළ චරිත හැසිරවූ පද්‍යයෙහි අංකය වනුයේ,
   (1) (i) ය. (2) (ii) ය. (3) (iii) ය. (4) (iv) ය.

[ දෙවැනි පිටුව බලන්න.

● පහත දක්වෙන වගුව ආශ්‍රයෙන්, අංක 6 සිට 9 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ක | ග | ජ | ට |
|---|---|---|---|
| කුවේණි<br>ජනේලය<br>මනරංජන වැඩවර්ජන | සඳකිඳුරු<br>මූදු පුත්තු<br>දේවතා එළි | වෙස්සන්තර<br>පබාවතී<br>බවකඩතුරාව | සුහ සහ යස<br>පුස්ලෝඩං<br>ගගන සරන කුරුල්ලෝ |

6. එදිරිවීර සරච්චන්ද්‍ර විසින් නිර්මාණය කරන ලද නාට්‍ය කාණ්ඩය,
   (1) ක ය. (2) ග ය. (3) ජ ය. (4) ට ය.

7. සයිමන් නවගත්තේගම විසින් නිර්මාණය කරන ලද නාට්‍ය කාණ්ඩය,
   (1) ක ය. (2) ග ය. (3) ජ ය. (4) ට ය.

8. හෙන්රි ජයසේන විසින් නිර්මාණය කරන ලද නාට්‍ය කාණ්ඩය,
   (1) ක ය. (2) ග ය. (3) ජ ය. (4) ට ය.

9. ගුණසේන ගලප්පත්ති විසින් 'යෙර්මා' නාට්‍යය ඇසුරෙන් අනුවර්තනය කරන ලද නාට්‍යය වන්නේ
   (1) සඳකිඳුරු ය. (2) මූදු පුත්තු ය.
   (3) පුස්ලෝඩං ය. (4) දේවතා එළි ය.

10. 'නෘත්ත' යනු
   (1) භාව ප්‍රකාශනයෙන් තොර නර්තනය වේ. (2) බටහිරින් බිහි වූ සංකල්පයෙකි.
   (3) 'භරතනාට්‍යම්'හි ප්‍රධාන මාධ්‍යයයි. (4) සතර අභිනය මගින් ඉදිරිපත් කැරෙන්නකි.

● පහත දක්වෙන සංවාද කොටස් ඇසුරු කැරගනිමින් අංක 11 සිට 14 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) "මං මේ කැලේ ඉන්න නරියෙක්. වංශෙ බොහෝම උසස්. සිහාල ගෝත්තරේ. ඒකට මොකද තවම පෙළවාසියක් කරගන්න බැරි උනා"

(ඉ) "(මදක් කල්පනා කර) බය වෙන්න එපා. මේ කටයුත්ත මට භාර දෙන්නකො. කාටත් හිරිහැරයක් කණගාටුවක් ඇති නොවන විදියට සමාදානෙන් වැඩේ ඉෂ්ට කරන්නම්කෝ."

(උ) "අනේ ඔච්චර කොයිතරම් හොඳ සිරිත් ද? අපේ ජාතියෙ උනත් ඒක තමයි අපි හුහක්ම ගරු කරන සිරිත."

(එ) "අනේ කොච්චර එකක් ද? දුවට ලැබෙන දෑවැද්ද කොච්චර උතුම් එකක් ද? ජීවිතාන්තෙ දක්වා මතක් වෙන්න තියාගන්න ඕනෑ දේවල්නේ. මං ඉතින් දෑවැද්දට දෙන්නෙ මොනව ද කියල ඇහුවෙවත් නෑ. සතුටෙන් දෙන එව්ව ගැන මොනවට ද අහන්නෙ, ඔය සංගයක් නැති අය ඇහුවට."

(ඔ) "මොනවද ඉතිං දුව සතුටු දේ තමයි අපි ගෙනාවෙ."

11. අසන්නා ගේ සිතේ කුතුහලයක් ඇති කරවන්නට සමත් ප්‍රකාශය වනුයේ,
   (1) අ ය. (2) උ ය. (3) එ ය. (4) ඔ ය.

12. මිනිස් වර්ගයාට හොඳ පාඩමක් කියාදෙන ප්‍රකාශය අතුළත් සංවාද ඛණ්ඩය,
   (1) ඉ ය. (2) උ ය. (3) එ ය. (4) ඔ ය.

13. ඒකල භාෂණයක් මගින් ඉදිරිපත් කැරෙන සංවාද ඛණ්ඩය වනුයේ,
   (1) අ ය. (2) උ ය. (3) එ ය. (4) ඔ ය.

14. ඉදිරියේ හොඳ ප්‍රතිඵලයක බලාපොරොත්තු ඇති කරවන සංවාද ඛණ්ඩය වනුයේ,
   (1) අ ය. (2) ඉ ය. (3) උ ය. (4) ඔ ය.

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක 15 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - සොකරි නාටකය
B - සන්නියකුම
C - ගම්මඩුව
D - සූනියම් යාගය
E - රටයකුම
F - කොහොඹාකංකාරිය
G - කෝලම්
H - පහන් මඩුව
I - ගරායකුම

15. උඩරට ප්‍රදේශයට ආවේනික ශාන්තිකර්ම ලෙස සැලකෙන්නේ,
(1) G, H ය. (2) A, F ය. (3) C, E ය. (4) H, D ය.

16. පහතරට ප්‍රදේශයෙහි බෙහෙවින් ප්‍රචලිත වූ ශාන්තිකර්ම වනුයේ,
(1) A, B, D ය. (2) B, D, E ය. (3) C, F, H ය. (4) E, H, I ය.

17. සබරගමු ප්‍රදේශයෙහි පවත්නා ශාන්තිකර්ම ලෙස සැලකෙන්නේ,
(1) A, F ය. (2) E, I ය. (3) C, H ය. (4) D, F ය.

18. උඩරට ප්‍රධාන ශාන්තිකර්මය වනුයේ,
(1) F ය. (2) A ය. (3) C ය. (4) H ය.

19. සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් සිදු කැරෙන ශාන්තිකර්ම වන්නේ,
(1) B, D, E, G ය. (2) E, F, D, H ය. (3) E, H, G, D ය. (4) A, C, F, I ය.

20. පෞද්ගලික යහපත අපේක්ෂාවෙන් සිදු කැරෙන ශාන්තිකර්ම සේ සැලකෙන්නේ,
(1) E, G, I ය. (2) C, F, G ය. (3) B, D, E ය. (4) D, C, G ය.

21. සිංහල නාට්‍ය කලාවේ නූතන යුගය සනිටුහන් වන්නේ
(1) නාඩගම්වලින් පසු ව ය. (2) නූර්තිවලට පසු ව ය.
(3) මනමේ නාටකයට පසු ව ය. (4) සොකරි රඟදැක්වීමත් සමග ය.

22. දේශානුරාගී හැඟීම් දනවන තේමා පදනම් කරගත් නාට්‍ය විශේෂය වනුයේ,
(1) කෝලම් ය. (2) නාඩගම් ය. (3) නූර්ති ය. (4) සොකරි ය.

● පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් අංක 23 සිට 28 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | මුල් කෘතියේ රචක | පරිවර්තනයේ/අනුවර්තනයේ නම | මෙරට නිෂ්පාදක ගේ නම |
|---|---|---|---|
| ඉක්නෙවිටාඉ | ක | ග | ජ |
| ට | ඩ | අහස් මාළිගා | ණ |

23. වගුවේ 'ක' කොටුවේ සඳහන් විය යුතු නම කුමක් ද?
(1) ටෙනසි විලියම්ස් (2) සොෆොක්ලීස් (3) සැමුවෙල් බෙකට් (4) යුරිපිඩීස්

24. වගුවේ 'ග' කොටුවේ සඳහන් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) අපට පුතේ මගක් නැතේ (2) පුත්‍ර සමාගම
(3) බෙර හඬ (4) ජන හතුරා

25. වගුවේ 'ජ' කොටුවේ සඳහන් විය යුතු නම කුමක් ද?
(1) බන්දුල ජයවර්ධන (2) හෙන්රි ජයසේන (3) ධම්ම ජාගොඩ (4) සුගතන්ද මහේන්ද්‍ර


26. වගුවේ 'ට' කොටුවේ සඳහන් විය යුතු නම කුමක් ද?
(1) ද වෙරි ඔවාර්ඩ් (2) ග්ලාස් මෙනාජරි (3) ද සීගල් (4) ද ලෝවර් ඩෙප්ත්ස්

27. වගුවේ 'ඩ' කොටුවේ සඳහන් විය යුතු නම කුමක් ද?
(1) ගාර්ෂියා ලෝර්කා (2) ඇන්ටන් චෙකොෆ් (3) ටෙනසී විලියම්ස් (4) බර්නාඩ් ෂෝ


28. මෙහි "ණ" කොටුවේ සඳහන් විය යුතු නම කුමක් ද?
(1) හෙන්රි ජයසේන (2) රංජිත් ධර්මකීර්ති
(3) සුගතපාල ද සිල්වා (4) පියදාස නිශ්ශංක

[ හතරවැනි පිටුව බලන්න.

- පහත දක්වෙන ඡායාරූප දෙක ආශ්‍රයෙන් අංක **29** සිට **32** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



ක



ග

29. මෙහි 'ක' ඡායාරූපයේ දක්වෙන්නේ,
    (1) සී. දෙන් බස්තියන් ය.
    (2) බී. ඒ. ඩබ්ලිව්. ජයමාන්න ය.
    (3) සිරිසේන විමලවීර ය.
    (4) චාල්ස් ඩයස් ය.

30. මෙහි 'ක' රූපයේ දක්වෙන නාට්‍යකරු ප්‍රසිද්ධියට පත් ව සිටියේ,
    (1) ටීටර් නාට්‍යයට ය.
    (2) නාඩගමට ය.
    (3) නූර්තියට ය.
    (4) ඉංග්‍රීසි නාට්‍යයට ය.

31. 'ග' ඡායාරූපයේ දක්වෙන නාට්‍යකරු වන්නේ,
    (1) දයානන්ද ගුණවර්ධන ය.
    (2) ගුණසේන ගලප්පත්ති ය.
    (3) එදිරිවීර සරච්චන්ද්‍ර ය.
    (4) එස්. විද්‍යානන්දන් ය.

32. 'ග' රූපයේ දක්වෙන නාට්‍යකරු ගේ නාට්‍ය නිර්මාණ දෙකක් වන්නේ,
    (1) නරිබෑණා හා පිංගුත්තර ය.
    (2) මූදු පුත්තු හා සඳකිදුරු ය.
    (3) මනමේ හා සිංහබාහු ය.
    (4) කර්ණාත් පෝර් හා රාවනේසන් ය.

- පහත දක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් **33** සහ **34** වැනි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



ක



ග

33. මෙහි දක්වෙන වෙස් මුහුණු අතුරෙන්,
    (1) 'ක' සන්නි මුහුණෙකි. 'ග' කෝළම් මුහුණෙකි.
    (2) 'ක' කෝළම් මුහුණෙකි. 'ග' සන්නි මුහුණෙකි.
    (3) 'ක' හා 'ග' සන්නි මුහුණු දෙකෙකි.
    (4) 'ක' හා 'ග' කෝළම් මුහුණු දෙකෙකි.

34. මෙම වෙස් මුහුණු දෙක,
    (1) අමුක්කු සන්නිය හා පොලිස් කෝළම යි.
    (2) ජස කෝළම හා මුදලි කෝළම යි.
    (3) ආරච්චි කෝළම හා ගුල්ම සන්නිය යි.
    (4) වාත සන්නිය හා බිහිරි සන්නිය යි.

[ පස්වැනි පිටුව බලන්න.

● පහත දක්වෙන තොරතුරු ඇසුරු කොටගනිමින් අංක **35** සිට **37** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


| | |
|---|---|
| A - මහාකෝල සන්නිය | B - දරු නැළැවිල්ල |
| C - නානු මුරය | D - වඩිග පටුන |
| E - අඹ විදමන | F - ගුරුගේ මාලාව |
| G - ඌරා යක්කම | H - සූනියම් යක්ෂිණිය |
| I - රාම මැරීම | J - මරා ඉපැද්දීම |

35. ගම්මඩුව ශාන්තිකර්මයෙහි දක්නට ලැබෙන නාට්‍යමය අවස්ථා දක්වනු ලැබ ඇත්තේ,
(1) D, J, G හි ය. (2) A, C, D හි ය. (3) E, I, J හි ය. (4) F, G, J හි ය.

36. සූනියම් යාගයෙහි ඇති නාට්‍යමය අවස්ථාව වන්නේ
(1) D ය. (2) C ය. (3) H ය. (4) F ය.

37. කොහොඹාකංකාරියෙහි දක්නට ලැබෙන හාස්‍යෝත්පාදක අංගය වන්නේ,
(1) I ය. (2) B ය. (3) F ය. (4) G ය.

38.



ඉහත දක්වෙන විදුලිය පහන
(1) ස්පොට් (තිත්) පහනෙකි.
(2) ස්ට්‍රිප් පහනෙකි.
(3) ෆ්ලඩ් පහනෙකි.
(4) ධාරාලෝක පහනෙකි.

● පහත දක්වෙන ඡායාරූපය ආශ්‍රයෙන් අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



39. මෙම ඡායාරූපයෙන් දක්වෙන්නේ,
(1) සෝමලතා සුබසිංහ ය. (2) වජිරා චිත්‍රසේන ය.
(3) රුක්මණී දේවි ය. (4) සන්ධ්‍යාකුමාරි ය.

40. ඇය ප්‍රසිද්ධියට පත් ව සිටියේ,
(1) 'මිනර්වා' නිළියක, ගායිකාවක හා චිත්‍රපට නිළියක ලෙසිනි.
(2) ළමා නාට්‍ය නිර්මාණවරියක හා චිත්‍රපට නිළියක ලෙසිනි.
(3) මුද්‍රානාට්‍ය ශිල්පිනියක හා නර්තන ශිල්පිනියක ලෙසිනි.
(4) ගායිකාවක, මුද්‍රානාට්‍ය ශිල්පිනියක හා නිළියක ලෙසිනි.

※※

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

50 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

※ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. පහත දක්වෙන සංවාද ඛණ්ඩය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(නුග ගසට ඉහළින් සඳ පායා ඇත. රංබරණා සහ හේතු ගෙයි ඉදිරිපස මිදුලේ වාඩි වී කතාබහේ යෙදී සිටිති.)

රංබරණා : ආරා තල් ගස ගොන් වැඩුණා සේ
මෝරා තල් මල එන අන්දන්
පිරා වරලස අවුල් හරින සේ
තල මල සුළඟට යන අන්දන්

හේතු : (එම කවිපද යළි ගයමින්) ලොකු අත්තෙ, ලොකු අත්තා කොහොමද ඔය තරම් ලස්සනට කවි සිපද, වන්නං කියන්ට ඉගෙන ගත්තෙ?

රංබරණා : ලොකු අත්තගෙ අප්පච්චිගෙන්

හේතු : ඒ අප්පච්චි ඉගෙනගත්තෙ

රංබරණා : එයාගෙත් අප්පච්චිගෙන්

හේතු : කිරිමුත්තේ !!

රංබරණා : අන්න හරි. කිරි මුත්තගෙන් තමයි. අත්තා, මුත්තා, නත්තා, පනත්තා, කිත්තා, කිරිකිත්තගෙ ඉඳල ඔවා කටින් කට ගෙනාපුවා.

හේතු : කිරි මුත්තෙ


රංබරණා : නැටුං ශිල්පෙ විතරක් නෙවි කොල්ලෝ. ජෝතිසේ, වෙදකම, බලි තොවිල්, කොහොඹා කංකාරි . . . ඔය ඕනෑ එහෙකට හපන්නු අපේ පරම්පරාව. කන්ද උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ මහරජ්ජුරුවන්ගෙ දේවින්නාන්සෙට වෙදකං කරල තියෙනව අපේ මී මුත්තෙක්. ඒවාට නම්බු නාම, ගම්බිම්, පදවි තානාන්තර ලබල තියෙනවා.

හේතු : ලොකු අත්තා මොනවා ද ඒ කාලෙ කළේ?

(i) හේතු රංබරණා ගේ කවුද? (ලකුණු 01 යි)
(ii) රංබරණා විසින් ගායනා කරන ලද කවිය කුමන වර්ගයේ ජන කවියක් ද? (ලකුණු 01 යි)
(iii) රංබරණා ප්‍රගුණ කර ඇත්තේ කවර ශිල්පය ද? (ලකුණු 01 යි)
(iv) රංබරණා ගේ පරපුරේ ශිල්පය පැවැත-ගෙන ආයේ කෙසේ ද? (ලකුණු 01 යි)
(v) 'අප්පච්චි' යන්නට සමානාර්ථය දෙන වචන දෙකක් ලියන්න. (ලකුණු 01 යි)
(vi) මෙම නාට්‍යයට පසුබිම වන්නේ ලංකාවේ කවර ප්‍රදේශය ද? (ලකුණු 01 යි)
(vii) රංබරණා ගේ පරපුර ප්‍රසිද්ධියක් ඉසුලූ ප්‍රධාන ශිල්පයට අමතර ව, එම පරපුර ප්‍රවීණත්වයක් දැරූ වෙනත් ශිල්පශාස්ත්‍ර කවරේ ද? (ලකුණු 01 යි)
(viii) මෙම සංවාද ඛණ්ඩයට ඇතුළත් ශාන්තිකර්මයක් නම් කරන්න. (ලකුණු 02 යි)
(ix) මෙහි දක්වා ඇත්තේ ආරම්භයේ තිරය විවර වුණාට පසු ව එන මුල් ම සංවාද ඛණ්ඩය යි. එම දර්ශනයේ පසුබිම සකසා ඇත්තේ කවර ආකාරයට ද? (ලකුණු 01 යි)
(x) මෙම නාට්‍යකරු විසින් රචිත තවත් නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

[ හත්වැනි පිටුව බලන්න.

**2.**



(i) මෙම ඡායාරූපයෙන් දක්වෙන ශාන්තිකර්මය නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) එම ශාන්තිකර්මය ප්‍රචලිත ලංකාවේ කවර ප්‍රදේශයක ද? (ලකුණු 03 යි)

(iii) මෙම රංග අවස්ථාව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** 'සමාරෝපය' යනු වේදිකා නාට්‍යකලාවට අයත් වැදගත් සංකල්පයකි.

(i) 'සමාරෝපය' යන්න පහදන්න. (ලකුණු 02 යි)

(ii) එහි ප්‍රභේද නිදසුන් ඇසුරෙන් තහවුරු කරන්න. (ලකුණු 04 යි)

(iii) එම අවස්ථාවට අවතීර්ණ වීමට නළුවකු අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 06 යි)


**4.** 'ගැටුම' යනු ප්‍රේක්ෂක ආකර්ෂණය වඩාත් දිනාගත හැකි අවස්ථාවකි.

(i) නාට්‍යයක 'ගැටුම' යන්න පහදන්න. (ලකුණු 03 යි)

(ii) ගැටුම් ප්‍රභේද කැර දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඔබ නැරඹූ ලංකාවේ ප්‍රසිද්ධ නාට්‍යයක් ඇසුරෙන් එකී ගැටුම් ප්‍රභේද **තුනක්** දක්වෙන අවස්ථා නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**5.**



(i) මෙම රංග භූමිය කුමන නාට්‍ය විශේෂය සඳහා භාවිත කරන ලද්දක් ද? (ලකුණු 02 යි)

(ii) මෙම නාට්‍ය විශේෂයේ ප්‍රභවය පිළිබඳ ඇති මතවාද මොනවා ද? (ලකුණු 04 යි)

(iii) උක්ත ගැමි නාටක විශේෂයේ රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

[ අටවැනි පිටුව බලන්න.

**6.** ආහාර්ය අභිනය නළු කාර්යයේ දී ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරයි.

(i) 'ආහාර්ය අභිනය' යන්න කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(ii) ආහාර්ය අභිනයට අයත් ප්‍රධාන අංග **තුන** නම් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) නළුවා ගේ රංග කාර්යය වඩාත් ඔපවත් කරගැනීමට ආහාර්ය අභිනයෙන් සිදු වන පිටිවහල විමසන්න. *(ලකුණු 06 යි)*

**7.** පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහි දී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කැරගත හැකි ය.

තමා හින්දි නිළියක තරම් රූමත් යැ යි සිතාසිටින සඳරේඛා ගේ එක ම අභිප්‍රාය වූයේ රිදී තිරයේ නිළියක වීම ය. තම පාසලේ අධ්‍යයන කටයුතු නිසි ලෙස නොකිරීම නිසා ඇයට ගුරුවරුන් හා යහළු-යෙහෙළියන් කිහිප විටක් ම අවවාද කළ ද, ඕ නිළියක වීම සඳහා දහවල් සිහින දැකීම නතර නොකළා ය. දිනක් පුවත්පතක දැන්වීමකට අනුව, ඕ ආධුනික නිළියන් තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා අයැදුම් පතක් දැම්මා ය. එතැන් සිට ඕ සම්මුඛ පරීක්ෂණය සඳහා ලිපිය පැමිණෙන තුරු මග බලා සිටියා ය. . . .

(i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා *(ලකුණු 04 යි)*

(ii) සංවාද සහ රංගවිධාන සහිත ව පෙළ රචනා කිරීම සඳහා *(ලකුණු 08 යි)*

※ ※ ※